## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2022

-----------------------------------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි  හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි  සැලැසුම්  කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන්  සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 31 ක විදේශ ප්‍රදාන සහ රු. මිලියන 31 ක භාණ්ඩාගාර ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි පරිච්ඡේද 106 සහ 107 ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව්කිරීම් සිදුකර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂය තුල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉහත වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව දේපළ පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය විකුණා බැහැර කිරීමේදී හෝ, එය පාවිච්චි කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා කිසිවක් අපේක්ෂා නොකරන විට පමණක් පොත්වලින් ඉවත් කළ හැකි වුවත්, ඊට පටහැනිව පිරිවැය රු. මිලියන 7 ක් වූ විද්‍යාත්මක උපකරණ 8 ක් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේ සිට ඉහත ප්‍රදර්ශන භාණ්ඩ ශුන්‍ය අගය සහිතව හෝ දේපල පිරියත උපකරණ සටහන තුල ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අක්‍රිය උපකරණ අයිතමයන් 62 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂය තුල එම තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී නිවාඩු දින දීමනා සඳහා රු. මිලියන 2 ක උපචිත වියදමක් ගිණුම්ගත කර තිබුණද, ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් එම වියදම අඩුකර දක්වා තිබූ අතර, ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී අදාල දෝෂය නිවැරදි කර පෙර වර්ෂයේ ලාභය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් සිදුකිරීමේදී නිවැරදිව සිදුකල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති සමුච්චිත ඌණතාවයට සමාලෝචිත වර්ෂය තුළ දී සිදු කර තිබූ රු. මිලියන 53 ක ගැලපීම්වලට අදාල පැහැදිලිකිරීම් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂය තුල මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන ලැබේ. | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති ශේෂයන්ට සිදුකරන ලද ගැලපීම් වලට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අංක 1 දරණ පරමාණුක ශක්ති ආරක්ෂණ රෙගුලාසිවල අයනීකරණ විකිරණ ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි | | | |
| (i) | 4(1) රෙගුලාසිය | විකිරණශීලී නිධි කැනීම, ඇඹරීම සහ පිරිසැකසුම සඳහා සභාව විසින් බලපත්‍ර ලබා දිය යුතු වුවත්, එම කටයුතු සිදුකරන රාජ්‍ය සමාගමක් සහ පුද්ගලික සමාගමක් වෙත බලපත්‍ර ලබා දී නියාමනය කර නොතිබුණි. තවද 2015 ජුලි 21 දිනැති අංක 1924/27 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව මුළු | පරික්ෂා කර නිර්දේශ ලබා දුන් සියලුම ඛනිජවැලි වල විකිරණශීලී සමස්ථානික වල (Th 232 / U 238) සක්‍රියතා සාන්ද්‍රණය (Activity Concentration) ගැසට් පත්‍රයේ සඳහන් අගයන් වන 10000 Bq/Kg වලට වඩා අඩු බැවින් එම බහාලුම් නියාමන සභාවේ නිර්දේශ අවශ්‍ය නොවන බව දන්වන ලදී. නමුත් අනුමැතිය ලබා දුන් ඛනිජ වැලි | පරමාණුක ශක්ති ආරක්ෂණ රෙගුලාසි වලට අනුකූල වන ලෙස බලපත්‍ර ලබා දිය යුතු අතර ගැසට් නිවේදනය ප්‍රකාරව සක්‍රියතා සාන්ද්‍රණය හෝ මුළු සක්‍රීයතාවය |

| | | | | |
|---|---|---|---|---|
| | | සක්‍රියතාවය හෝ සක්‍රියතා සාන්ද්‍රණය අදාල නිදහස් කිරීමේ මට්ටම් නොඉක්මවිය යුතු වුවත් මුළු සක්‍රියතාවය ( total activity ) ( Th 232/U 238 - බෙකරල් 10,000 ) අදාල නිදහස්කිරීමේ මට්ටම ඉක්මවා තිබියදී සභාව විසින් පරමාණුක බලශක්ති පනතේ 19 වගන්තියේ බලතල ප්‍රකාරව උක්ත සමාගම් විසින් සිදුකරන විකිරණශීලී ඛනිජ වැලි අපනයනයන් සභාවේ නියාමන පාලනයෙන් නිදහස් කර තිබුණි. | සාම්පලවල අඩංගු Th-232 හා U-238 තොගයේ මුළු සක්‍රියතාවය(Total Activity) 10000 Bq ඉක්මවන බව ඉතා පැහැදිලිය. ඊට හේතුව 1Kg ප්‍රමාණ විශාල ප්‍රමාණයක් එක් වූ තැනක සක්‍රියතාවය10000 Bq වඩා වැඩි වීම ස්වභාවික සංසිද්ධියකි. | යන අවශ්‍යතා දෙකෙන් එකක් හෝ අදාල නිදහස්කිරීමේ මට්ටම ඉක්මවන ක්‍රියාපිළිවෙත් සඳහා බලපත්‍ර නිකුත් කර නියාමනයට යටත් කළ යුතුය. |
| (ii) | 22(ආ), 26(අ) (i) හා 41 (ඇ) රෙගුලාසිය | විකිරණ සේවකයින්ගේ වෘත්තීමය නිරාවරණ අදාල මාත්‍රා සීමා නොඉක්මවන පරිදි පවත්වාගැනීම සඳහා පිරිස් මන්තුකරණ උපකරණ (Personal dosimeters) සපයා දී මාත්‍රාවන් සම්බන්ද මිනුම් පවත්වා ගැනීම බලපත්‍රලාභින්ගේ වගකීමක් වුවත්, බලපත්‍රලාභී ආයතන 300 ක් විසින් එම පහසුකම් විකිරණ සේවකයින් වෙත සපයා නොතිබියදී සභාව විසින් බලපත්‍ර දීර්ඝ කර තිබුණි. විකිරණ සේවකයින්ගේ වෘත්තීමය නිරාවරණයන් සම්බන්ධ තොරතුරු සභාව විසින් රැස්කර ලේඛණ ගත කර නොතිබුණි. | ඉදිරියේදී මන්තුකරණ උපකරණ (Personal Dosimeters) සේවාව ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සලකා කටයුතුකරන බව දක්වමින් ලිපියක් මඟින් අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත. මෙහිදී එම සේවාව පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් අදාල ආයතන වෙත ලබා දී ඒවා විශ්ලේශණය කිරීමද, එහි වාර්තා තබා ගැනීමද එම ආයතනය විසින් කරනු ලැබේ. | පිරිස් මන්තුකරණ උපකරණවලින් ලබාගන්නා මාත්‍රා මිනුම් අදාල සීමාවන් ඉක්මවා නොමැති බව පරීක්ෂාකිරීමෙන් පසුව පමණක් බලපත්‍ර දීර්ඝකළ යුතු අතර නියාමන ආයතනය වශයෙන් සියළුම වෘත්තීමය නිරාවරණයන් සම්බන්ධ මධ්‍යගත තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2020 ජනවාරි 31 දිනට ප්‍රථම විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සමඟ ලියාපදිංචි විය යුතු වුවත් 2022 දෙසැම්බර් 31 වන විටත් සභාව විසින් එම පද්ධතිය සමඟ ලියාපදිංචි වී නොතිබුණි. | චක්‍රලේඛ අංක 08/2019 අනුව භාණ්ඩාගාරයෙන් විමසීම් කරන ලද අතර එම චක්‍රලේඛයට අනුව මිලියන 200 කට වඩා වැඩි ප්‍රසම්පාදන/ව්‍යාපෘති පමණක් මෙයට අදාල බව පෙන්වා දෙන ලදී. ඒ අනුව දැනට නියාමන සභාවේ එවැනි ප්‍රසම්පාදන සිදු නොවන බැවින් ඊට අදාල ආකෘති ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙත දැනුවත් කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර පාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී මාස 5ක් ගත වීමට පෙර සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට පෙර වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම (APRM) පැවැත්විය යුතු වුවත් සභාව විසින් ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | මෙම වසරේ සිට වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම (APRM) පැවැත්වීමට කටයුතු මේ වන විට සැලසුම් කර ඇත. | -එම- |
| (ඈ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විදේශ ආධාර සම්බන්ධ සියලු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කළ යුතු වුවත් ඊට පටහැනිව ගෝලීය බලශක්ති ද්‍රව්‍ය සුරක්ෂිතතාව පිළිබඳ එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ වැඩසටහන ( GMS ) යටතේ විදේශ ආධාර පුද්ගලික සමාගම් වෙත ලබාගෙන තිබුණි. විදේශ ආධාර ලැබීම් සහ වියදම් දක්වමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ විදේශ ආධාර ගිවිසුම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම හදිසි ප්‍රතිචාර ආරක්ෂණ පද්ධතියේ සම්බන්ධීකාරක පාර්ශවයන්ගේ බලතල, වගකීම් සහ කාර්යයන් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම් නොතිබීම හේතුවෙන් හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීමේ වගකීම සහ අදාල උපකරණවල නඩත්තුව සහ ආරක්ෂාව නෛතිකව පවරා දී නොතිබුණි. | ව්‍යාපෘතියෙහි ආරක්ෂණ කටයුතු සම්බන්ධව විශ්ලේෂණයක් ඉහත භෞතික ආරක්ෂණ පද්ධති ස්ථාපිත කර ඇති සියලුම ස්ථාන පරික්ෂාකරමින් 2020 වසරේ ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත්ව සිදු කරන ලදී. එහි මූලික අවශ්‍යතාවය වූයේ එම අමාත්‍යාංශය යටතේ පවතින සියලුම හමුදා හා අනෙකුත් ආයතන වෙත වගකීම් පවරා දෙමින් ඔබ විසින් සඳහන් කර ඇති පරිදි අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටයි. එම නිරීක්ෂණ වල වාර්තාවක් ද සකස් කොට ඇති අතර අදාළ ඉදිරි කටයුතු ආරක්ෂක අමාත්‍යාංශය විසින් සිදු කරනු ඇති බව නියාමන සභාව බලාපොරොත්තු වේ. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු තවද අතර හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක වීම සඳහා වන වගකීම් සම්බන්ධයෙන් අදාල පාර්ශව සමඟ කඩිනමින් ගිවිසුම් ගත විය යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,095,416 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,412,059 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,683,357 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදාන ලෙස රු. 30,818,683 ක් ලැබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.29,903,741 කින් අඩුවී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කලමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 46 වගන්තිය ප්‍රකාරව හිමිකම් නොමැති විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ පාලනය නොපමාව ලබාගැනීම හෝ නැවත ලබාගැනීම සඳහා ජාතික ක්‍රමෝපායක් සකස් කළ යුතු වුවත් එවැනි ජාතික ක්‍රමෝපායක් සකස් කර නොතිබුණි. | පනතේ 46 වගන්තිය ප්‍රකාරව හිමිකම් නොමැති විකිරණශීලී ප්‍රභවයන් පිලිබඳ පාලනය පිලිබඳව සුදුසු පරිදි සමාලෝචනයක් කර අවශ්‍යතාවය අනුව ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | උක්ත පනතේ 12 (ඔ) වගන්තියේ බලතල ප්‍රකාරව විකිරණ සම්බන්ධ සේවා සැපයීම බාහිර පාර්ශව වෙත විවෘත කිරීම සඳහා අවශ්‍ය කාර්ය පටිපාටි සකස් කල යුතු වුවත් ඒ සඳහා සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | අදාල කාර්යය පටිපාටි සහ යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා දැනටමත් නියාමන සභාව විසින් කමිටුවක් පත්කොට ඇති අතර ඉදිරි කාලයේදී එය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තුවේ. | -එම- |
| (ඇ) | 2021 අප්‍රේල් 20 දින සභාවේ බලපත්‍රයක් නොමැතිව අධිබලැති විකිරණශීලී ද්‍රව්‍ය රැගත් නෞකාවක් හම්බන්තොට වරායට ඇතුළු වී 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 18 සහ 48 (1) වගන්ති යටතේ වරදවල් සිදුකර තිබුණද සභාව විසින් අදාල දේශීය නැව් නියෝජිත සමාගමට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග වලට එළඹ නොතිබුණි. | නියාමන සභාව තොරතුරු දැනගත් වහාම එම නැව වරායෙන් පිටතට යැවීමට අදාළ උපදෙස් ලබා දෙනු ලැබිය. ඒ අනුව අදාළ නෞකාව වරායෙන් පිටතට ගන්නා ලදී. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් මගින් සිදුවීම විමර්ශනය කරන ලදී. එහිදී නැව් සමාගමේ දේශීය නියෝජිතයා විසින් ප්‍රකාශ කලේ නැවෙහි ඇතිවූ යාන්ත්‍රික දෝෂයක් සහ එම නැව හා හම්බන්තොට වරාය අතර තොරතුරු හුවමාරු වීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයක් නිසාවෙන් එම නැව වරායට ඇතුළු වූ බවයි.නියාමන සභාවට ඇති බලතල අනුව අදාළ නැව් සමාගමේ දේශීය ඒජන්තයා වෙත වසර දෙකකට ශ්‍රී ලංකා වරායවල් හරහා | පනතේ 18 වගන්තිය උල්ලංඝනය කිරීම රු .මිලියන 3 ට නොවැඩි දඩයකට හෝ වසර හතකට නොවැඩි කාලයක් සඳහා වන බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගතකිරීම යන දෙකටම හෝ යටත් විය යුතු වරදක් බැවින් එවැනි වැරදි සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි. |

| | | | |
|---|---|---|---|
| | | විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම තහනම් කරමින් බලපත්‍ර ලබාදීම අත්හිටුවන ලදී. | |
| (ඇ) | පිළිකා ප්‍රතිකාරක රජයේ රෝහල් වල භාවිත කර අවසන් ඉහළ ක්‍රියාකාරී ප්‍රභවයක් (කාණ්ඩ 1) වන කොබෝල්ට් 60 විකිරණශීලී ද්‍රව්‍යයේ ක්‍රියාකාරීත්වය අඩු වන තෙක් (කාණ්ඩ 3 දක්වා) යම් කාලයක් පරමාණුක බලශකත්ති මණ්ඩලය සතු මධ්‍යගත විකිරණශීලී අපද්‍රව්‍ය ගබඩාවේ තාවකාලිකව ගබඩා කර එම සියළු විකිරණශීලී අපද්‍රව්‍ය එක් අවස්ථාවකදී අදාල නිෂ්පාදන රට වෙත යැවීම මගින් වරින් වර අපනයනය කිරීමේදී රජයට දැරීමට වන අධික වියදම් අඩුකර ගත හැකි අතර එම මූලද්‍රව්‍ය වෙනත් විකල්ප විකිරණ සේවා සඳහා භාවිතා කිරීම මගින් රජයට ප්‍රති අපනයනය සඳහා වියදම් දැරීමට සිදු නොවන අතර අමතර ආදායමක් ලබා ගත හැකිය. ඉහත පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් එම විකිරණශිලී අපද්‍රව්‍ය අනාරක්ෂිතව රෝහල් පරිශ්‍රවල පැවතුණි. | පිළිකා ප්‍රතිකාර සඳහා භාවිතා කර අවසන් කාණ්ඩ 1 වර්ගයේ විකිරණශීලී ප්‍රභව දැනට රට තුල ගබඩා කිරීමට සුදුසු ආරක්ෂිත ගබඩාවක් නොමැති අතර කාණ්ඩ 3,4 සහ 5 වර්ගයේ විකිරණශීලී ප්‍රභව පමණක් ගබඩා කිරීමට ගබඩාවක් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතුව ඇත. එවැනි කාණ්ඩ 1 වර්ගයේ විකිරණශීලී ප්‍රභව වෙන් වෙන්ව හෝ එකවර අදාළ නිෂ්පාදකයා වෙත යැවීමේදී පිරිවැයේ විශාල වෙනසක් සිදු නොවේ. කෙසේ වෙතත් එම විකිරණශීලී ප්‍රභව විකල්ප විකිරණ සේවා සඳහා යොදා ගැනීමට කිසිවෙකුත් නියාමන සභාවෙන් මේ වන තෙක් ඉල්ලීම් කර නොමැති අතර ඉදිරියේදී එවැනි ඉල්ලීමක් සිදුකල හොත් ඒ සඳහා නියාමන සභාව කටයුතු කරනු ලැබේ. | පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ඉහළ ක්‍රියාකාරී( කාණ්ඩ 1 ) විකිරණශීලී මූලද්‍රව්‍ය සඳහා තාවකාලික ගබඩා පහසුකම් සපයන අතර ඒ සඳහා අවශ්‍ය භෞතික ආරක්ෂණ පද්ධතියක්ද සභාව මැදිහත් වී සපයා තිබුණි.තවද අබාවිත ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ප්‍රභවයන් ප්‍රතිචක්‍රීකරණය සඳහා වන ක්‍රමෝපායන් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 12 (ඉ), 59(2) හා 60 වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව අත්සන් කර ඇති න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැලැක්වීම පිළිබඳ සම්මුතිය යටතේ වන අතිරේක චර්යා ගිවිසුම (additional protocol) විධිමත් ලෙස බලාත්මක කිරීම සඳහා ඊට අදාල ශ්‍රී ලාංකීය ව්‍යවස්ථාපිත කාරණා ඉටුකර ගන්නා තුරු ආකෘති අතිරේක චර්යා ගිවිසුම ශ්‍රී ලංකාව තුල කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට 2018 අප්‍රේල් 3 දිනැති අංක 18/0522/727/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණද සභාව විසින් ඊට අවශ්‍ය ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සම්පූර්ණ කර නොතිබුණි. එසේම උක්ත සම්මුතියේ 39 ව්‍යවස්ථාව අනුව ගිවිසුමේ වගකීම් | 2019 දක්වා අතිරේක ප්‍රොටෝකෝලය අත්සන් කිරීමට පනතට අදාළ යම් නීතිමය කටයුතු සැලකිල්ලට ගනු ලැබූ නමුත් 2019 දක්වා සිටි නීති නිලධාරිනිය සේවයෙන් ඉල්ලා අස්වියාමෙන් පසුව එම තනතුර පුරප්පාඩු විය. ඊට සුදුසුකම්ලත් අයෙකු පත්කර ගැනීම සම්බන්ධව රජයේ වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් පසුගිය වර්ෂ කිහිපය පුරා රජය විසින් සියළු බඳවා ගැනීම් අත්හිටවූ බැවින් නියාමන සභාවට එය කඩිනමින් පුරවා ගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති අන්තර්ජාතික ගිවිසුම්වල වගකීම් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට අනුබද්ධ විධිවිධානයන් සවිස්තරාත්මකව ශ්‍රී ලංකාව විසින් සකස් කළ යුතු වුවත් 2019 වර්ෂයෙන් පසු ඒ සඳහා සභාව විසින් මැදිහත් වීම් සිදුකර නොතිබුණි. | | |
| (ආ) | උක්ත පනතේ 12 (ග) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ මෙරටදී ලබා ගත හැකි යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, විකිරණශීලීතාවය පිරික්සීම සඳහා සාම්පල් ලබා ගැනීම සහ සභාව අවශ්‍යයැයි හෝ යෝග්‍යයැයි සලකන අවස්ථාවක ඒ පිරික්සුමේ ප්‍රතිඵල මහජනයාගේ සහ අදාල සියලු නිලධාරීන්ගේ දැන ගැනීම පිණිස පළකිරීම සිදුකල යුතු වුවත් සභාව විසින් විකිරණශීලී ද්‍රව්‍ය පැවතිය හැකි ආනයනික පාරිභෝගික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන අහඹු පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධව නියාමන අවශ්‍යතාවයක් ලෙස පරමාණුක බලශක්ති මණ්ඩලයද අහඹු ලෙස මෙවැනි පරීක්ෂණ සිදුකර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් විකිරණ මට්ටම් ඉක්මවා යන ද්‍රව්‍ය මෙතෙක් හඳුනාගෙන නොමැත. ඊට අතිරේකව මහජනයාගෙන්ද මේ සම්බන්ධව කිසිඳු පැමිණිල්ලක් ලැබී නොමැත. | මිනිස් පරිභෝජනයට නුසුදුසු අහිතකර විකිරණශීලී ද්‍රව්‍ය සහිත ආහාර ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා පනත ප්‍රකාරව සභාවේ වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | උක්ත පනතේ 18 වගන්තිය ප්‍රකාරව පරමාණුක බලශක්ති මණ්ඩලයද ඇතුළුව සියළු තැනැත්තන් විසින් සිදු කරන අයනීකාරක විකිරණ සම්බන්ධිත සෑම ක්‍රියා පිළිවෙතක්ම (Practices) බලපත්‍ර ලබා දී නියාමනය කිරීමේ වගකීම සභාව සතුය. ඒ අනුව මණ්ඩලය විසින් සපයන විකිරණශීලීතා මට්ටම් මිනුම් කිරීම, විකිරණ මිනුම් උපකරණ ක්‍රමාංකන සේවය, මාත්‍රා මිතික සේවය සහ වැඩබිම් අධීක්ෂණ සේවා වැනි සේවාවන් අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පනතේ 12(ඕ) වගන්තියේ බලතල ප්‍රකාරව සභාව විසින් කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් සකස් කළ යුතු වුවත් සභාව විසින් එවැනි කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් කෙටුම්පත් කර නොතිබුණි. | පනතේ 18 වන වගන්තියට අනුව නියාමන සභාව බලපත්‍ර ලබා දෙනු ලබන්නේ අයනීකරණ විකිරණ භාවිතය වන ස්ථාන සඳහා වන අතර සේවා සැපයුම් වෙනුවෙන් බලපත්‍ර ලබා දීමක් සිදු කරනු නොලබයි. ඒ අනුව මණ්ඩලය මගින් සිදු කරන සේවා සඳහා බලපත්‍ර ලබා දීමක් සිදු නොකරන අතර මණ්ඩලයේ විකිරණශීලී ද්‍රව්‍ය භාවිතය හා ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් නියාමන සභාව මගින් බලපත්‍ර ලබා දී නියාමනයට යටත් කර ඇත. | පනතේ අර්ථනිරූපනය අනුව ක්‍රියාපිළිවෙත යන්නට මිනිසුන් නිරාවරණයට ලක්වීම හෝ ලක්වීමේ ඉඩකඩ වැඩිකරන සියළු මිනිස් ක්‍රියාකාරකම් ඇතුලත් වේ. පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව අයනීකාරක විකිරණ සම්බන්ධිත සේවාවන්ද ඇතුලත් අයනීකාරක විකිරණ සම්බන්ධිත සියළු ක්‍රියාපිළිවෙත් නියාමනය කල හැකි පරිදි අවශ්‍ය යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කළ යුතුය. |
| (ඈ) | උක්ත පනතේ 48 (2) (අ) වගන්තිය ප්‍රකාරව විකිරණශීලී ප්‍රභවයන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීමට සභාවේ අනුමැතිය දීම | මේ සම්බන්ධව පනතේ 48 (1) යටතේ ආනයන අපනයන ක්‍රියාවලීන් සම්බන්ධව අනුමැතිය ලබාදීම් නියාමන | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා යොදාගත යුතු අවශ්‍යතා සහ කාර්යපටිපාටිය ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශ පදනම් කර ගනිමින් සාදන ලද රීති මත පදනම් විය යුතු වුවත් සභාව විසින් අන්තර් ජාතික මාර්ගෝපදේශ සුදුසු පරිදි යොදාගෙන රීති සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාව විසින් සිය අභිමතය පරිදි ආනයන සහ අපනයන සඳහා සිය අනුමැතියන් ලබා දෙන බව නිරීක්ෂණය විය. | සභාව විසින් සිදු කරනු ලැබේ. නමුත් ඔබගේ 48 (2) (අ) කරනු යටතේ කරන ලද විමසීම යටතේ ඉදිරි කටයුතු කිරීමට මේ සම්බන්ධයෙන් සමාලෝචනයක් කිරීමට බලාපොරොත්තු වේ. දැනට මෙයට ආනයන අපනයන සම්බන්ධ ක්‍රමවේදයක කෙටුම්පතක් සකසා ඇති අතර එය දැනට අධ්‍යනයට ලක් කර ඇත. එමෙන්ම ඉදිරියේදී කාර්යය මණ්ඩල ප්‍රමාණය වැඩි කර ගැනීමකින් පසු හා නීති නිලධාරිගේද සහාය ඇතිව ඉදිරි කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | උක්ත පනතේ 69 (1) වගන්තිය ප්‍රකාරව අයනීකාරක ද්‍රව්‍ය උපද්දන කැණීම් සහ පිරිසැකසුම් මෙහෙයුම්වලට අදාළ ක්‍රියාකාරකම් පවත්වන සියලු පුද්ගලයන් විසින් අනුකූලතාවය දැක්විය යුතු කම්කරුවන්, මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතා සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මඟින් පැනවිය යුතු වුවත් එවැනි රීති කිසිවක් කෙටුම්පත් කර හෝ නොතිබුණි. | දැනට ලංකාවේ මෙවැනි ක්‍රියාකාරකම් ඉතා සීමිත බැවින් එවැනි රීතියක් සෑදීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන නොමැත. තවද මෙවැනි රීති සෑදීම සඳහා අප ආයතනය තුළ මෙම ක්ෂේත්‍රය සම්බන්ධව දැනුමැති පුද්ගලයින් නොමැති බැවින් ඉදිරියේදී පවතින ව්‍යාපෘතියක් මගින් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ විශේෂඥ සහය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම- |